# බළන්ගොඩ නගර සභාව
## 2019-08-15 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.08.15**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවල මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

2019-08-15 වන දින මාසික මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමා, 2019.07.09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2019.07.09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විමසා සිටි අවස්ථාවේ දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් සංශෝධනයන් ලෙස පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් වල තමාගේ ප්‍රකාශයේ තමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයෙකු වන අතර තම සහයෝගය පොදුජන පෙරමුණට ලබා ලෙසට සංශෝධනය විය යුතු බව පැවසීය.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- බළන්ගොඩ නගර සභාව හා පළාත් පාලන සංසදය එක්ව මහජන නියෝජිතයින් සඳහා සංවිධානය කරනු ලබන සභා කටයුතු පිළිබඳ පුහුණු වැඩමුළුවක් නීති උපදේශක පාලිත අභයවර්ධන මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2019.08.18 වන දින පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇති අතර ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම අනිවාර්ය බව පවසා සිටියේය.
- මේ දිනවල බළන්ගොඩ නගරය තුළ මහජනතාවට හානිවන පරිදි සුනඛ ඝනත්වය ඉහළ ගොස් ඇති බැවින් එයට විසඳුමක් ලෙස පළාත් පාලන ආයතන විසින් සිදු කළ යුතු සුනඛ ගැහැනු සතුන් සඳහා ලබා දෙන ඩිපෝප්‍රොවේරා එන්නත ලබා දෙන බවට සභාව දැනුවත් කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- බලංගොඩ තානායම් පිවිසුම් මාර්ගය "අබුසාලි මාවත" ලෙසත්, දෙහිගස්තලාව මහවත්ත මාර්ගය "මරික්කාර් මාවත" ලෙසත් වෙනස් කිරීමට විරුද්ධව බලංගොඩ ජනතාව විසින්

අත්සන් 535 කින් යුතුව ඉදිරිපත් කරන ලද පෙත්සමෙහි අත්සන් ලේඛනය ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

- "බළන්ගොඩ අපි" මිතුරු සංසඳය විසින් තානායම් පිවිසුම් මාර්ගය සඳහා ජාති ආගම් සහ පක්ෂ භේදයකින් තොරවූ දීර්ඝ කාලයක සිට භාවිතා කළ නාමය වෙනස් කර වෙනත් නමක් ස්ථාපිත නොකරන ලෙස ඉල්ලා ඇති ලිපිය සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.
- බළන්ගොඩ නගර සභාව සතු සතිපොළ භූමියේ පිහිටි අංක 01ඒ හා අංක 01 දරණ ගොඩනැගිලි බදු ගැනුම්කරුවන් විසින් පිටස්තර අයට අතුරු බදු දීම තුළින් ඔවුන් තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම කරගෙන යාම නිසා ඊට නුදුරින් පිහිටි සිල්ලර වෙළඳසැල් වලට ඉමහත් අසාධාරණයක් සිදුව ඇති බව පවසා අසාධාරණයට ලක්වූ වෙළෙඳ ප්‍රජාව විසින් එවා ඇති ලිපිය සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- උඩ ඇල්ලෙපොල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඩබ්.යූ.පියල් අරුණශාන්ත මහතා විසින් බස්නැවතුම්පල පදික කඩයක් ඉල්ලා ඉදිරිපත් කර තිබූ ලිපිය සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ බස්නැවතුම්පල පදික කඩ ඉදිකිරීමේදී 64 දෙනෙකුගෙන් යුත් පදික වෙළඳුන්ගේ නම් ලැයිස්තුවක් ලබා ගත් අතර එයින් 32 දෙනෙකුට පමණක් එම කඩ කාමර ලබා දුන් බැවින් ඉතිරි පිරිසගෙන් විමසා ඔවුන්ගේ කැමැත්ත ඇතිව එයින් කඩ කාමරයක් ලබාදිය හැකි බවයි.

මෙහිදි අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් නගර සභාව වෙත පවරා ගනු ලැබූ බස්නැවතුම්පල පදික කඩ කාමර වල තැම්පත් මුදල් ආපසු ඔවුන් වෙත ලබා දෙන ලෙස පවසා සිටියේය.

- බළන්ගොඩ, බූලත්ගම ලිපිනයේ පදිංචි අනුර එදිරිවීර ජයසේකර කුරුඳුපටබැඳිගේ, එදිරිවීර ජයසේකර කුරුඳුපටබැදිගේ ඉන්දික කුමාර, එදිරිවීර ජයසේකර කුරුඳුපටබැදිගේ සුජීව ජයසේකර යන මහත්වරුන් විසින් නීතිඥ පී.ආර්.චාන්දනී හේමමාලි සෙනරත් මහත්මිය මඟින්, ලේකම්තුමිය විසින් 2019/07/26 දින බනස/ආ/11/13 යටතේ පොදු වෙළෙඳසැල මාළු කඩ අංක 09/10 දරණ කඩ කාමරයන්හි සන්තකය බළන්ගොඩ නගර සභාවට ලබා දීමට ක්‍රියා කරන ලෙස දැන්වූ ලිපියට පිළිතුරු වශයෙන් එවූ එන්තරාවාසිය සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.
- බළන්ගොඩ, මිරිස්වත්ත අංක 312 ලිපිනයෙහි පදිංචි මොහොමඩ් ජුනයිදීන් මොහොමඩ් ඉස්මත්, බළන්ගොඩ, රාස්සගල පාරේ අංක 28 ලිපිනයෙහි පදිංචි මොහොමඩ් ජුනයිදීන් මොහොමඩ් ෆයිරූස්, මොහොමඩ් ජුනයිදීන් බදුරුන්නිසා, මොහොමඩ් ජුනයිදීන් සිත්ති නලීපා සහ සයිමන් උම්මා, බළන්ගොඩ, කල්තොට පාරේ අංක 93, "ඔරේන්ජ් හිල්" හි පදිංචි විජේරත්න බස්නායක මුදියන්සේලාගේ එරංග දේශප්‍රිය බස්නායක සහ විජේරත්න

බස්නායක මුදියන්සේලාගේ සුමේධ චමින්ද බස්නායක යන අය විසින් නිතීඥ විජේරත්න කොඩිප්පිලි මහතා ඉදිරියේ බණ්ඩාර උයන්වත්ත ලෙස හැඳින්වෙන ඉඩම නගර සභාව විසින් එළි පෙහෙළි කිරීමට විරුද්ධව වරින් වර සංශෝධිත 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 220 වන වගන්තිය ප්‍රකාරව ලබාදෙන ලද නොතීසිය සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

- **බලංගොඩ සමාජ සංවර්ධන පදනම විසින් 2018.08.08 වන දින මහ සභා වාරයේ යෝජනා අංක 05.10.01 යෝජනාව සම්බන්ධව එවා තිබූ ලිපිය**

බලංගොඩ සමාජ සංවර්ධන පදනම මඟින් ඉදිරිපත් කර තිබූ එම ලිපිය ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී. එම ලිපියෙහි සඳහන් වූයේ නගරයේ ප්‍රධාන මාර්ගයේ අතුරු මාර්ගයක් වන තානායම් පිවිසුම් මාර්ගය "එම්.එල්.එම්.අබුසාලි මාවත" නමින් නම් කරන ලෙස බළන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරයෙකු විසින් ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධ සභා වාර්තාව කියවා බැලීමේදී එය දෝෂ සහිත සහා සම්මුතියකින් තොර වූ යෝජනාවක් වීම, සභාවට යෝජනාව ඉදිරිපත් කොට ඇති ආකාරය පිළිබඳ මාර්ග ස්මාරක පනතේ සඳහන් කරුණු උල්ලංඝනය කිරීම හා මහජන විරෝධතා කැඳවීම ගැසට් පත්‍රයක් මඟින් සිදු නොකර තිබීම හේතුවෙන් ජනතාව ඒ පිළිබඳ දැනුවත් නොවීම ආදී හේතු පදනම් කරගනිමින් මේ පිලිබඳව සභාවේ අවධානය යොමු කර මහජන විරෝධතා කැඳවන ලෙසයි.

- **බැංකියවත්ත ප්‍රදේශයේ පවතින මැසි උවදුර සම්බන්ධවයි.**

බලංගොඩ ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරන ජන දිරිය වැඩසටහනෙහි මැද්දෙකන්ද කොට්ඨාශයේ පැවති සාකච්ඡාවේ දී බැංකියවත්ත ප්‍රදේශයේ පවතින මැසි උවදුර උග්‍රවී ඇති බැවින් මහජනතාව මහත් අසීරුතාවයට ලක් වී ඇති බවත් ඒ සඳහා විසඳුමක් ලබා දෙන ලෙසත් මහජනතාව විසින් යෝජනා කළ බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

- **මාර්ග නාමය ප්‍රතිශෝධනය කිරීම හා නාම පුවරුවක් ස්ථාපිත කිරීම**

කොටුගොඩැල්ල පාරේ පිහිටි කොටුව පෙදෙස ඓතිහාසික ලන්දේසි බලකොටුව මුල්කර ගනිමින් නම් කළ අතර අර්ථකතනයේදී කිසියම් දෝෂ සහගත බවක් ඇති බැවින් එය Fort Avenue යන අර්ථයට සමානව "බලකොටුව පෙදෙස" යනුවෙන් නිවැරදි කර අදාළ නාම පුවරුව ස්ථාපිත කර දෙන මෙන් ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

- **කොමර්ෂල් හන්දිය ඉදිරිපිට යකඩ වැට ඉවත් කර ගැනීම.**

  මහ මාර්ග දෙපාර්තමේන්තුව මගින් පරණ කොමර්ෂල් හන්දිය ඉදිරිපිට ඉදි කර ඇති යකඩ පයිප්ප වැට නිසා එම ස්ථානයේ පවතින වෙළඳසැල් වලට අවහිරයක් වන බවත්, එම නිසා සමහර වෙළඳසැල් වෙළඳාම නොමැති නිසා අතහැර ඇති බවත් පවසා වෙළඳසැල් හිමියන් විසින් එවා ඇති ලිපිය ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාගත කරන ලදී. එම නිසා වාහන ඇතුල් කිරීමට හැකි වන පරිදි එම යකඩ වැටෙන් කොටස් දෙකක් ඉවත් කර දෙන මෙන් ඉල්ලා තිබුණි.

- **අනතුරු දායක කොස්ගස සම්බන්ධවයි**

  අංක 128/14 D, බලගහමුල, සේනක පෙදෙස, බලන්ගොඩ ලිපිනයෙහි පදිංචි මොහොමඩ් උම්මු සමුදා මහත්මිය විසින් තමාගේ ඉඩමෙහි පිහිටි අනතුරුදායක කොස්ගස කපා ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස පවසා එවා තිබූ ලිපිය ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කර ලදී.

**04. කල් දී ඇති ප්‍රශ්න**

**04:01 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා**

**04:01:01** පොදු වෙළෙඳසැලේ ටෙන්ඩර් මගින් ලබා දී ඇති ජයසේකර මුදලාලි මහතාගේ මාළු කඩය ටෙන්ඩර් කිරීමට විරුද්ධව පැවති නඩුවේ දැන් පවතින වර්තමාන තත්වය පිළිබඳ ගරු සභාව දැනුවත් කරන්න.

ඒ සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ පැමිණිලිකරු මිය යාම හේතුවෙන් ඔහුගේ දරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුව ඉල්ලා අස්කර ගැනීමට කටයුතු කර ඇති බව සභාවේ නීතීඥවරයා විසින් දැනුම් දී ඇති අතර ලිඛිත වාර්තා මේ වන තෙක් කාර්යාලයට ලැබී නොමැති බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විමසා සිටියේ ඔවුන්ගෙන් සභාවට අයවිය යුතු අලාභය අයකර ගන්නේ කෙසේද යන්නයි.

එහිදී පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ ඉදිරියේදී නීති උපදෙස් ලබා ගනිමින් අදාළ නිතීමය පියවර ගන්නා බවයි.

**04.02 ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය**

**04.02.01** මුගුණමලේ මාර්ගයේ ගොඩකර ඇති කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් වර්තමානය වන විට එහි තත්වය කවරේද?

**04.02.02** මුගුණමලේ සුසාන භූමිය නගර සභාව වෙත පවරා ගැනීමට වූ යෝජනාවේ වර්තමාන තත්වය කවරේද?

මෙහිදී 04.02.01 ප්‍රශ්නය වෙත පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ පිළිබඳව ලිපියක් මඟින් බුලත්ගම ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත දැනුම් දී ඇති අතර මේ වන තෙක් පිලිතුරක් ලැබී නොමැති බවයි. එමෙන්ම 04.02.02 ප්‍රශ්නය පිළිබඳව අදහස් දක්වමින් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලිපියක් මඟින් අවශ්‍ය කටයුතු සඳහා යොමුකර ඇති බව පැවසීය.

**05. කල් දී ඇති යෝජනා**

**05.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

**05.01.01** ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් එම්.ඒ.අමිල ප්‍රභාත් මුණසිංහ මහතා පත්කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් වශයෙන් එම්.ඒ.අමිල ප්‍රභාත් මුණසිංහ මහතා පත්කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2018.06.04 දිනැති සභාවේ 05.01.03 යෝජනාව යටතේදී ද ගරු සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම්වරයෙකු බඳවා ගැනීම සභා සම්මත වූ බැවින් නැවත වරක් වෙනත් අයෙකුගේ නමක් යෝජනා කරන්නේ ඇයිදැයි විමසා සිටියේය.

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පවසා සිටියේ එම පුද්ගලයා වෙනත් රැකියාවක් සඳහා ගිය බැවින් ඔහු සේවයට නොපැමිණි නිසා මොහුගේ නම ඉදිරිපත් කළ බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05:01:02** පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා පවසා සිටියේ පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර සඳහා එදිරිවීර ජයසේකර කුරුඳුපටබැඳිගේ පියදාස මහතා විසින් සභාවට විරුද්ධව ගෙන ගිය නඩුව එතුමාගේ ඇවෑමෙන් පසුව ඔහුගේ දරුවන් විසින් ඉල්ලා අස්කර ගෙන ඇති බැවින් අදාළ කඩ කාමර දෙක සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව සභාවේ නීතිඥවරයා විසින් ප්‍රකාශ කර ඇති බවයි.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද **ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා** විසින් පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර සම්බන්ධ නඩුව පිළිබඳ මහාධිකරණයේ තීන්දුව සභාවට පක්ෂපාතීව ලැබුණු අතර නැවත ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට නඩුව යොමු කල පසු ඊ.ජේ.කේ.පී.පියදාස මහතා මිය ගිය බවත්, එනිසා ඔහුගේ දරුවන් නඩුව ඉල්ලා අස්කර ඇති නමුත් නඩුව නිසා විශාල පාඩුවක් සිදු වූ බවත් පැවසීය. එබැවින් සභාවට සිදුවී ඇති අලාභය නීති උපදෙස් මත අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් ටෙන්ඩර් කරන්නේනම් එළවළු හැර සියලුම මස් මාළු කඩ ටෙන්ඩර් කරන ලෙසත් පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වමින් පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 1980/46 චක්‍රලේඛය පරිදි මාළු හා මස් කඩ සම්බන්ධයෙන් ක්‍රියා කල අතර අනතුරුව මාළු කඩ ටෙන්ඩර් කිරීම පිළිබඳ පළාත් සභාවෙන් මතය විමසූ පසු එහිදී සියළුම මාළු කඩ ටෙන්ඩර් කරන ලෙස දැනුම්දුන් බව පැවසීය. අනතුරුව අංක 09/10 මාළු කඩ හිමියන් මාළු කඩ ටෙන්ඩර් කිරීමට විරුද්ධව මෙම නඩුව ගොනු කරමින් සභාව වෙත රිට් ආඥාවක් ගෙන ආ බැවින් ඒ අනුව ක්‍රියාකළ බව ද ඉතිරි මාළුකඩ ටෙන්ඩර් කිරීමට නොහැකි වූ බව ද පැවසූ ගරු මන්ත්‍රීතුමා අදාළ නඩුව 1980/46 චක්‍රලේඛය මත පැමිණිලි පාර්ශවය ගෙන ගියද මහ ඇමතිතුමාගෙන් ලැබුණු නියෝගය නිසා සභාව නඩුව ජයගත් බව සඳහන් කලේය. එමෙන්ම මෙම මාළු කඩ දෙක පමණක් නොව සියළු මාළු කඩ ටෙන්ඩර් කරන ලෙස වැඩිදුරටත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර ගුණරත්න මැතිතුමා** විමසා සිටියේ පළාත් පාලන ඇමතිවරයෙකු විසින් නිකුත් කරනු ලබන නියෝගයක් එම ඇමතිතුමා ඉවත්

වූ පසුව තවදුරටත් වලංගු වන්නේ ද, අප සභාව නැවත වෙනස් වූ විට එය නැවත අලුත් වෙනවා ද තව දුරටත් වලංගු ද එහි නීතිමය පදනම කුමන්ද යන්නයි.
වැඩිදුරටත් අදහස් දක්වූ ගරු මන්ත්‍රීතුමා පවසා සිටියේ අලාභය අයකිරීම සම්බන්ධව හදිසි තීරණයක් ගැනීමට තමා විරුද්ධ අතර මේ සම්බන්ධව සාකච්ඡා කර පසුව සුදුසු තීරණයක් ගැනීම සුදුසු බවයි. මෙය බරපතල තීන්දුවක් නිසා නිතී උපදෙස් ලබා ගනිමින් සභාව හා මාළු වෙළෙඳුන් දෙපාර්ශවයම රැකෙන පරිදි තීන්දුවක් ගැනීම සුදුසු බව ද මෙම කඩ කාමර දෙක පවරා ගැනීමට ඉක්මනින් කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් පැවසීය.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව නීති උපදේශක මහතාගෙන් නීති උපදෙස් ලබා ගත් නමුත් මේ වන විටත් කඩ කාමරය සභාව වෙත පවරා ගැනීම සම්බන්ධව තීරණයක් ගැනීමට සභාව ප්‍රමාද බවයි.

මෙහිදී අදහස් දක්වූ **ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** පවසා සිටියේ ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ ඇවෑමෙන් මෙම කඩ කාමර නගර සභාව වෙත පවරා නොගෙන ඔවුන්ගෙන් කඩ කුලී අයකර ගනිමින් සභාව දැනටමත් වැරැද්දක් සිදු කර ඇති බැවින් හැකි ඉක්මනින් කඩ කාමර දෙක සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසයි.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා** මේ පිළිබඳව අදහස් දක්වමින් මෙම නඩුව සම්බන්ධයෙන් මහාධිකරණයෙන් ලබාදුන් තීන්දුව අභියෝගයට ලක්කරමින් ජයසේකර මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව ගොනු කිරීමෙන් අනතුරුව ඔවුන් නඩුව ඉල්ලා අස්කර ගත්ත ද මහාධිකරණය විසින් ලබා දුන් තීන්දුව වලංගු බවත්, ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ දරුවන් පියාගේ නමට කඩකුලී ගෙවා අයිතිය පිළිගෙන ඇති බැවින් ඔවුන්ගේ දරුවන්ගෙන් සභාවට සිදු වූ අලාභය අයකර ගත හැකි බවත් පැවසීය.

මෙහිදී අදහස් දක්වූ **ගරු සභාපතිතුමා** පවසා සිටියේ මෙම අවස්ථාවේදී පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර දෙක සම්බන්ධව තීරණ දෙකක් ගැනීමට සිදුවන අතර ඉන් පළමුවැන්න වන්නේ කඩ කාමරය නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කිරීම වන අතර අනෙක වන්නේ අලාභය අයකර ගැනීමට කටයුතු කිරීම බවයි.

නැවත වරක් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අවශ්‍ය නීතිමය කටයුතු ඉක්මනින් සිදු කරන ලෙස යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා** අදහස් දක්වමින් ධීවර සංස්ථාව සඳහා කඩ කාමරයක් ලබා දීමට සභාවට හැකිනම් අවුරුදු ගණනක් තිස්සේ මෙම කඩ කාමරවල වෙළඳාම් කළ අයටම මෙම මාළු කඩ දෙක ලබා දීමට

ක්‍රමයක් නොමැති ද යන්න විමසා සිටියේය. එසේ හැකියාවක් තිබේ නම් සභා සම්මතයක් ගෙන එසේ ක්‍රියා කිරීම සුදුසු බව වැඩිදුරටත් පැවසීය.

පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර දෙක සම්බන්ධව අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** පවසා සිටියේ කිසිවෙකු සමග පෞද්ගලික අමනාපයක් නොමැති නමුත් මේ සම්බන්ධව නීතිමය ප්‍රශ්නයක් පවතින බවයි.

එමෙන්ම මෙම අවස්ථාවේ දී නගර සභාව එම කඩ කාමර දෙක පවරා නොගතහොත් නගර සභාවට මෙම කඩ දෙක අහිමි වී යාමේ හැකියාවක් පවතින බැවින් නීත්‍යානුකූලව සභාව වෙත පවරා ටෙන්ඩර් කිරීමෙන් අනතුරුව ඔවුන්ටම නැවත ලබා ගැනීමේ අවස්ථාව පවතින බවත්, මෙම අවස්ථාවේදී නීතිය ක්‍රියාත්මක නොකිරීම නිසා ආයතනයට විශාල පාඩුවක් විය හැකි බවත් පෙන්වා දෙන ලදී.

මෙහිදී අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය** ලබන සභා වාරයේදී මේ සම්බන්ධව සාකච්ඡා කර තීන්දුවක් ගැනීම සුදුසු බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** නැවත අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල අංක 09, 10 මාළු කඩ කාමර දෙක නගර සභාව වෙත පවරා ගෙන ටෙන්ඩර් කිරීමකින් තොරව සභා අනුමැතියක් ගෙන ඔවුන්ටම භාර දීම සුදුසු බව සඳහන් කළ අතර එසේ කටයුතු නොකලහොත් සභාවට අවාසිදායක තත්ත්වයක් උදාවිය හැකි බැවින් අදාළ පුද්ගලයින් සභාවට ගෙන්වා සාකච්ඡාවක් සිදු කිරීම සුදුසු නොවන බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා** පවසා සිටියේ ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ පුතුන් සභාවට ගෙන්වා මතය විමසා තීරණයක් ගැනීම සුදුසු බවයි. සභාව විසින් සර්ව සාධාරණව මෙම කටයුතු ඉටු කරනු ලැබුවත් ඔවුන්ගේ සාධාරණයක් බලාපොරොත්තු විය නොහැකි බැවින් සභාව විසින් මෙවැනි වගකීමක් ගැනීම සුදුසු නොවන බව පැවසීය.

ඉහත යෝජනාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ඊ.ජේ.කේ.පී.පියදාස මහතාගේ පුතුන් වන ඉන්දික කුමාර මහතා හා අනුර ජයසේකර කුරුඳු පටබැඳිගේ මහතා පැමිණ සිටි බැවින් ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් ගරු උප සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලද අතර, එම සාකච්ඡාවෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව අදහස් ඉදිරිපත් කළ **ගරු සභාපතිතුමා** සභාවේ ආදායම යනු සභා දේපල වන අතර සියලු මන්ත්‍රීවරුන් සද්භාවයෙන් විශාල වගකීමක් ගෙන සභාවේ මෙම තීන්දුව ගනු ලැබුවද මෙම තීරණයට ඔවුන්ගෙන් යහපත් ප්‍රතිචාරයක් හිමි නොවූ

හෙයින් පොදු වෙළෙඳසැල මාළු කඩ අංක 09/10 කඩ කාමර සන්තකය නගර සභා ආඥා පනත අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව සභාව වෙත නීත්‍යානුකූලව පවරා ගනිමින් ටෙන්ඩර් කිරීම හා ටෙන්ඩර් නොකිරීම මත සභාවට සිදුව ඇති අලාභය අයකර ගැනීමට නීතිඥ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:03 බළන්ගොඩ පරිවාස කාර්යාලයේ අත්‍යවශ්‍ය ඉදිකිරීමේ ගිවිසුම් කාලය ඉක්මවා ඇති බැවින් එම ගිවිසුම අවලංගු කර පිළිගත් වෙනත් සමිතියක් හෝ කොන්ත්‍රාත්කරුවෙකු වෙත ඉතිරි ඉදිකිරීම් කටයුතු ලබා දීම.

බළන්ගොඩ පරිවාස කාර්යාලයේ අත්‍යවශ්‍ය ඉදිකිරීම් වල ගිවිසුම් කාලය ඉක්මවා ඇති නමුත් අදාළ ඉදිකිරීම් මෙතෙක් සම්පූර්ණ කර නොමැති බැවින් එම ගිවිසුම අවලංගු කර පිළිගත් වෙනත් සමිතියක් හෝ කොන්ත්‍රාත්කරුවෙකු වෙත ඉතිරි කොටස් ඉදිකිරීමේ කටයුතු ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් පවසා සිටියේ උක්ත කරුණ සම්බන්ධයෙන් සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් නිරන්තරවම විමසීම් සිදුකරන අතර මෙම කර්මාන්තයට අදාළ ඇස්තමේන්තු ගත මුදල රු.1,988,081.01 ක් වන අතර එම මුදලින් පළමු කොටස් ගෙවීම ලෙස රු.163,227.15 ක මුදලක් ගෙවා අවසන් බවත්ය. මෙම කර්මාන්තයට අදාළව රු.1,824,853.86 මුදලක් දැනට ඉතිරිව තිබෙන බැවින් එම මුදලින් අදාළ අලුත්වැඩියාව සිදු කළ හැකි සමිතියක් හෝ කොන්ත්‍රාත්කරුවෙකු වෙත මෙම වැඩ කොටස් ලබා දීම සුදුසු බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙම කර්මාන්තයේ කොන්ත්‍රාත්කරු වන උඩුමුල්ල මෛත්‍රී ග්‍රාම සංවර්ධන සමිතිය විසින් කර්මාන්තය අතරමග දී නතර කිරීම හේතුවෙන් මෙම ගැටළුව උද්ගත වී ඇති බව තවදුරටත් ප්‍රකාශ කළ ගරු සභාපතිතුමා ඉතිරි මුදලින් නිමකල යුතු ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කල නොහැකි බැවින් සමිති කිහිපයක්ම මෙම කර්මාන්තය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇති බව ප්‍රකාශ කරන ලදී. එබැවින් මෙම ඉතිරි වැඩ කොටස් සඳහා නව ඇස්තමේන්තුවක් සකස් කර නැවත පළාත් පරිවාස දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීම සුදුසු බව යෝජනා කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ04 වැලිහරනාව මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු සමඟි සුහසාධක සමිතියට ලබා දීම.

වැලිහරනාව මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු සමඟි සුහසාධක සමිතියට ලබා දීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05ඃ01ඃ05 සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා සුසර සංගීත සංසඳයට ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා සුසර සංගීත සංසඳයට ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා, බළන්ගොඩ ප්‍රදේශයේ සියළුම සංගීත ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් 2019.09.21 දින පැවැත්වෙන මෙම සංගීත ප්‍රසංගයට ක්‍රීඩා පිටිය ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ අතර විවෘත ප්‍රසංගයක් බැවින් රු.30,000.00ක තැම්පත් මුදලක් හා ක්‍රීඩා පිටිය සඳහා අය කරන දෛනික මුදල අයකර අවසරය ලබා දීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වූ **ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** පවසා සිටියේ මොහාන් එල්ලාවල මාවතෙහි කොටසක් ලබා දිය හැකි අතර එසේ දුනහොත් ක්‍රීඩා පිටිය රැක ගැනීමට හැකියාවක් ලැබෙන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් සංගීත ප්‍රසංගය පැවැත්වෙන අවස්ථාවේ දී ක්‍රීඩාපිටියට කිසිදු වාහනයක් හෝ කොඩි කණුවක් ඇතුල් නොකරන බවත්, ප්‍රේක්ෂකයන් පමණක් ඇතුල් කරන බවත් සංවිධායක මණ්ඩලය විසින් දැනුම් දුන් බව පවසන ලදී.

මේ පිළිබඳව **ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා** අදහස් දක්වමින් ක්‍රීඩාංගණය ලබා දීම පිළිබඳ තමන්ගේ අකමැත්තක් නොමැති අතර පිට්ටනිය රැක ගැනීම සඳහා දැඩි නීති රීති පනවන ලෙස පැවසීය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් රු.30,000.00 ක ඇප තැම්පතුවක් තබා ගනිමින් කොමර්ෂල් බැංකුව ඉදිරිපිට මාර්ගය වේදිකාව සකස් කරගැනීම සඳහා ලබා දීමට සුදුසු බව යෝජනා කල අතර ගරු උප සභාපති ටී.එම්.ටී.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

05:01:06 රාස්සගල පාරේ තානායම් ගෙදර පාර ඉදිරිපිට මාර්ගය "කුඹුර පාර" නමින් නම් කිරීම.

රාස්සගල පාරේ තානායම් ගෙදර පාර ඉදිරිපිට මාර්ගය "කුඹුර පාර" නමින් නම් කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම මාර්ගය "කුඹුර පාර" ලෙස නම් කිරීමට ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් ලැබී ඇති බවයි.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටියේ මෙම මාර්ගය සඳහා "කුඹුර පාර" යන නාමය සුදුසු නොවන අතර මේ සඳහා සුදුසු වෙනත් නාමයක් ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කර ලබන සභාව වෙත ඉදිරිපත් කරන බවයි.

## 06. මන්ත්‍රි යෝජනා

### 06:01 ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවල මැතිතුමා

06:01:01 මේ වන විට බලගහමුල ප්‍රදේශයේ ඩෙංගු වසංගතයේ යම් කිසි ව්‍යාප්තියක් දක්නට ඇති අතර මෙම තත්ත්වය පාලනය කර ගැනීම සඳහා නගර සභාව බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයද සම්බන්ධ කර ගනිමින් යම් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.

ගරු නාගරික මන්ත්‍රි අකිල එල්ලාවල මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අදහස් දක්වමින් මෙම යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම පිලිබඳ ස්තුතිවන්ත අතර මේ දිනවල පවතින වර්ෂාපතනය සමඟ මෙය කාලෝචිත යෝජනාවක් වන බව පැවසීය. එමෙන්ම විශේෂයෙන් බලගහමුල ප්‍රදේශයේ වැඩි වශයෙන් ඩෙංගු ව්‍යාප්තියක් දක්නට ඇති බැවින් බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමා තමන් හමුවූ අවස්ථාවේ සභාව දැනුවත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිය බව පවසන ලදී.

වර්තමානයේ නව තාක්ෂණය මගින් මදුරුවන් විනාශ කිරීමට විශාල මුදලක් වැය නොකර විවිධ ක්‍රම භාවිතා කළ හැකි බවත්, සාමාන්‍යයෙන් දෛනිකව යොදන පිලියම් වලට මදුරුවන් අනුවර්ථනය වී ඇති බවත් පැවසීය. එම නිසා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමාට සාකච්ඡාවක් සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ද මේ

පිලිබඳව විශාල වගකීමක් නාගරික මන්ත්‍රීවරුන්ට පවතින බව ද අවධාරණය කරන ලදී.

මහජනතාව කොතරම් දැනුවත් කල ද කාලයත් සමග ඔවුන්ට නැවත මෙය අමතක වන බව පැවසූ ගරු මන්ත්‍රීතුමා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීතුමා සමග සාකච්ඡාවක් සිදු කර ඔවුන්ගේ විශේෂ උපදෙස් රැගෙන මහජන පොළ, පාසල් ආදී පොදු ස්ථාන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ප්‍රායෝගික ක්‍රියාකාරකම් (වීථි නාට්‍ය) ආදිය මඟින් ජනතාව දැනුවත් කිරීම ආදිය සිදු කළ හැකි බව පවසා සිටියේය. වැඩිදුරටත් අදහස් දක්වමින් මේ සඳහා පෞද්ගලික ආයතන හා බැංකුවල සහය ලබා ගත හැකි බවත්, සෑම මන්ත්‍රීවරයෙකුටම තමාගේ කොට්ඨාශයේ ඩෙංගු ව්‍යාප්තිය සම්බන්ධයෙන් වගකීමක් දැරිය යුතු බවත් පැවසීය.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් රාජ්‍ය ආයතනවල මදුරුවන් බෝවන ස්ථාන වැඩි වශයෙන් දැකිය හැකි අතර විශේෂයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම්වල වැඩි වශයෙන් දැකිය හැකි බැවින් ඔවුන්ට නඩු පවරන ලෙස පවසන ලදී.

මෙහිදී පිළිතුරු ලබා දුන් සභාපතිතුමා, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීගේ ප්‍රධානත්වයෙන් ඩෙංගු කමිටුවක් පැවැත්වූ අතර සංවර්ධනය නොවූ ඉඩම් වල මෙන්ම වගා නොකරන ලද කුඹුරු ඉඩම්වලද විශාල වශයෙන් මදුරුවන් බෝවන ස්ථාන දැකිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:02 ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

06:02:01 ඕලුගංතොට අඹ සෙවණ අසලින් නාන තොටුපලට යන මාර්ගය එළිපෙහෙලි කර සංවර්ධනය කිරීම.

06:02:02 ඕලුගංතොට අනුර මල්ශාලාව ඉදිරිපිට ඇති නාන තොටුපොළ ආසන්නයේ ඇති නිදහස් කළාපය ප්‍රයෝජනයට ගෙන සභාවට ආදායම ලැබෙන ආකාරයට රථ වාහන අංගනයක් ඉදිකිරීම.

06:02:03 සියඹලාගහවත්ත පන්සල යට පාරේ පාරට අවහිර වනසේ ඇති දැනට පාවිච්චි නොකරන ලිඳ කඩා ඉවත් කිරීම

ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා මීට පෙර අවස්ථාවකදී ද මෙම යෝජනාව ගෙන ආ බව පවසා ඕලුගංතොට අඹ සෙවණ අසලින් නාන තොටුපලට යන පඩිපෙළ මාර්ගය දෙපස කැළෑ වැවී තිබෙන බැවින් එය සංවර්ධනය කර ප්‍රයෝජනයට ගත හැකි ලෙස ඉඩ සැලැස්වුවහොත් නගරයෙන් පිටට ඇදී යන මුදල් නවතා ගත හැකි බව සඳහන් කරන ලදී. එමෙන්ම එම ස්ථානයේ තිබෙන කඩ හිමියන්ට ද මෙය විශාල ප්‍රයෝජනයක් වන බැවින් මෙම මාර්ගය එළිපෙහෙළි කර සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

එමෙන්ම අනුර මල්ශාලාව ඉදිරිපිට නාන තොටුපල අසල පඩිපෙල ආසන්නයේ ඇති නිදහස් කළාපය සංවර්ධනය කර රථ වාහන අංගනයක් හා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ඉවත් කළ කඩ කාමර වෙනුවට කඩ කාමර ඉදි කර ඔවුන්ට ලබා දීම සිදු කළහොත් සභාවට ආදායමක් ඉන් ලැබෙන බව පැවසීය.

සියඹලාගහවත්ත පන්සලට පහළින් ඇති පාර අවහිර වන සේ ඇති දූනට භාවිත නොකරන ලිඳ කඩා ඉවත් කිරීම සම්බන්ධව ප්‍රදේශවාසීජනතාවගේ විරෝධතාවයක් නොමැති බැවින් ඉක්මනින් මෙය ඉටු කර දෙන ලෙස පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

06:03:01 බළන්ගොඩ බස්නැවතුම්පල උඩ තට්ටුවෙහි ගමන් පහසුව සඳහා ඇති කවුළු තුළ නොයෙකුත් අසංවර ක්‍රියා සිදුවීම වැලැක්වීම සඳහා එම කවුළු තුළ කඩයක් හෝ වෙනත් දෙයකට යොමු කර සභාවට ආදායම වැඩි කර ගැනීමට කටයුතු කිරීම.

06:03:02 බළන්ගොඩ පෙට්ටිගල ප්‍රධාන මාර්ගයේ අප නගර සභා සීමාවට අයිති කොටසේ කාණු සුද්ධ කිරීම හා පාර ශුද්ධ කිරිම සඳහා අපගේ කම්කරුවන් හෝ යොදා මාර්ගය පිළිසකර කරදීම සහ කානු ගොඩ දමා දීම. (බොහෝ තැන්වල ඩෙංගු බෝ වීමටද මේ වන විට ඉඩ ඇත)

06:03:03 කොටුගොඩැල්ල සුනිල් මහතා, උඩවත්ත මහතා සහ දයා මහත්මියගේ ගෙවල් සඳහා යාමට ඇති කොන්ක්‍රීට් ලෑලි පාලම කැඩී ඇත. එය අලුත්වැඩියා කර දීමට කටයුතු කර දීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා බළන්ගොඩ බස්නැවතුම්පල උඩ තට්ටුවෙහි ගමන් පහසුව සඳහා ඇති කවුළු තුළ මහජනතාව අඩුවෙන් ගැවසෙන නිසා ගැහැණු, පිරිමි ළමයි අසංවරව සිටින අයුරු හා පිරිමි ළමුන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන අයුරු දක ගත හැකි බව පැවසීය.

එමෙන්ම පෙට්ටිගල මාර්ගය පිළිබඳව තමන් කිහිපවරක් සභාවේදී කථා කළ අතර පළාත් මාර්ග හා විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් කොටසේ කාණුව විශාල වශයෙන් කැඩී තිබෙන බවට අදාල ආයතනවලට ලිඛිතව දනුම් දී අනතුරුව වාචිකව කථා කළ ද ඉන් ප්‍රයෝජනයක් නොමැති වූ බව පැවසීය. එමෙන්ම තම බල ප්‍රදේශයේ මහජනතාව සභාවට ගොස් කරන්නේ මොනවාදැයි තමාගෙන් විමසන බැවින් අප සභාවෙන් හෝ මෙය ඉටු කිරීමට හැකිනම් වඩාත් සුදුසු බව පැවසීය.

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා 06:03:01 යෝජනාව පිළිබඳ අදාල ස්ථානය පරික්ෂා කරනු ලබන බවත්, 06:03:02 යෝජනාව පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරිය ලිඛිතව දනුවත් කරන බවත් පැවසීය. එම කානු පද්ධතිය පිලිසකර කිරිමේ කටයුතු නගර සභාව මඟින් සිදු කළ නොහැකි අතර නිවාස වල බැමි කාණුවට ඇලවී තිබෙන බව දක්නට ලැබෙන බැවින් එහි වගකීම සභාවට ගත නොහැකි බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා ප.ව.01.30 ට පමණ සභාවෙන් පිටව යන ලදී.

**06:04 ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී.සමරසේකර මැතිතුමිය**

06:04:01 ශෛලතලාරාම විහාරස්ථාන මාර්ගයේ පොදු පහසුකම් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීම.

06:04:02 දොරවෙල සිට මුගුණමලය දක්වා මාර්ගයේ කාණු ගොඩදැමීමට ජේ.සී.බී යන්ත්‍රය හා ටිපර් රථය නැවත වරක් ඉල්ලා සිටීම.

06:04:03 මුගුණමලය මාර්ගයේ කොන්ක්‍රීට් කර ඇති ස්ථාන අබලන් වී ඇති බැවින් එම ස්ථාන නඩත්තු කිරීම.

06:04:04 අංක 06 කාර් පාක් කඩය ආනන්ද මහතාට ලබා දීම සම්බන්ධයෙන් 2018.05.28 පැවති මහ සභාවේ තීරණය වූ අතර එයට විකල්පයක් වශයෙන් නගර සභාව සතු වෙනත් කඩයක් ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය පවසා සිටියේ ශෛලතලාරාම මාර්ගයේ ප්‍රජාශාලාවක් නොමැති අතර ප්‍රජාශාලාවක් ඉදිකිරීම සඳහා විහාරස්ථානයේ ඉඩමක් පවතින බවයි.

එමෙන්ම ශෛලතලාරාම විහාරස්ථානය මඟින් ලබාදී ඇති ඉඩම් වල පස් පුරවා ඉඩම් ගොඩ කර ඇති බැවින් ගඟට වතුර බැස නොයාම නිසා වැසි අවස්ථාවලදී පයින් ගමන් කල නොහැකි තත්වයක් උදා වී ඇති බව පැවසූ මන්ත්‍රීතුමිය වතුර බැසීමට ක්‍රමයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය.

එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා මන්ත්‍රීතුමියගේ ඉල්ලීමක් හා ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමක් ලබා දෙන ලෙසත් එවිට "නිල සෙවන" වැඩසටහන යටතේ මෙය ඉටු කළ හැකි බවත් පැවසීය.

එමෙන්ම මෙසේ ඉඩම් ගොඩ කර ඇති ඉඩම් හිමියන්ගෙන් විස්තරයක් කඩිනමින් ලබා ගන්නා අතර 06:04:04 යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් බස් නැවතුම්පොල පදික කඩයක් ලබා දිය හැකි බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:05 ගරු නාගරික මන්ත්‍රි එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා**

06:05:01 බළන්ගොඩ, තුඹගොඩ බදුලු- කොළඹ මාර්ගය සහ රාස්සගල මාර්ගය යා වන පරිදි ගුවන් පාලමක් ඉදිකර පාසල් දරුවන්ගේ හා මඟී ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම.

06:05:02 රත්නපුර මාර්ගයට යාබදව පිහිටි ගල් පොත්තාරාම ඉඩමෙහි වගාවට නුසුදුසු කුඹුරු ඉඩම ගොඩ කර සංවර්ධන කටයුතු කිරීමට අවශ්‍ය පියවර හා අවස්ථාව ලබා දීම.

ගරු නාගරික මන්ත්‍රි එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කල **ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා** පවසා සිටියේ මෙය තමන්ගේ යෝජනාවක්ම පමණක් නොව සභාවේම යෝජනාවක් බවයි. එම නිසා පාසල් වේලාව අතරතුර පාසල් දරුවන් විශාල පිරිසක් තුඹගොඩ ප්‍රදේශයේ දක්නට ලැබෙන බැවින් පක්ෂ භේදයකින් තොරව මෙය ඉටු කරමු යැයි පවසා සිටියේය.

එමෙන්ම මගීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් මෙය ඉතා ප්‍රයෝජනවත් බැවින් කෙසේ හෝ මෙය ඉටු කිරීම බළන්ගොඩ ජනතාවට කරන විශාල සේවාවක් බව පැවසූ අතර බලගහමුල හන්දියෙහි ද එවැනිම ගුවන් පාලමක් ඉදිකිරීමට හැකිනම් එය ද ඉතා යෝග්‍ය බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

06:05:02 යෝජනාව පිලිබඳ අදහස් දක්වමින් ගල්පොත්තාරාව ඉඩමෙහි අයිතිකරුවන් එකොලොස්දෙනෙකු පමණ සිටින අතර ඔවුන් සියළුදෙනා මෙම ඉඩම ගොඩකර සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස සභාපතිතුමාගෙන් ලිඛිත ඉල්ලීමක් කර ඇති බව පැවසීය. විශේෂයෙන් බෝතල් කටු ආදිය එහි පැවතීම නිසා වගා කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බැවින් බළන්ගොඩ නගරයට පිවිසෙන විට මුලින්ම හමු වන මෙම ඉඩම සංවර්ධනය කර වෙළෙඳ සංකීර්ණයක් ඉදි කරන ලෙස ඉල්ලා සිටින ලදී.

06:05:01 යෝජනාව පිලිබඳ අදහස් දක්වූ **ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා** පවසා සිටියේ මෙය කාලීන අවශ්‍යතාවයක් බවයි. එමෙන්ම මේ සඳහා විශාල මුදලක් දැරීමට සිදු වන නමුත් තුඹගොඩ විශාල ආයතන කිහිපයක් තිබෙන බැවින් හා මෙම ස්ථානය ජනාකීර්ණ වන බැවින් මෙය ඉටුකිරීමට යුහුසුළුව කටයුතු කිරීම සුදුසු බව පැවසීය.

06:05:02 යෝජනාව පිලිබඳ අදහස් දක්වමින් ගල්පොත්තාරාව කුඹුරු ඉඩම එකොලොස් දෙනෙකුට අයිතිව තිබෙන බැවින් එක් පුද්ගලයෙකුට පර්චස් 6 ක පමණ කොටසක් ලැබෙන බව පැවසීය. එමෙන්ම මෙම ස්ථානය බළන්ගොඩ නගරයේ පිවිසුම වන නිසාත් නගරයේම කුණු කසළ එම ස්ථානයට ගොස් රැඳී පවතින නිසාත් මෙම කුඹුර අස්වැද්දිය නොහැකි නිසාත් මෙය ගොඩ කිරීම සුදුසු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා අදාළ ආයතන වලට දන්වා සභාවට ආදායමක් ලැබෙන ලෙස මෙය සංවර්ධනය කිරීම සුදුසු බව වැඩිදුරටත් සඳහන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා** ගුවන් පාලම පිළිබඳ අදහස් දක්වමින් මේ සම්බන්ධව වෙළෙඳ සංගමය විසින් පැල්මඩුල්ල මාර්ග සංවර්ධන ඉංජිනේරුතුමාට ලිපියක් මඟින් දැනුම් දීමෙන් අනතුරුව මේ පිළිබඳව සාකච්ඡා කිරීමේදී අනුමැතිය ලබා දුන් නමුත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සොයා ගැනීම කළයුතුව ඇති බව සඳහන් කරන ලදී.

ගල්පොත්තාරාව කුඹුරු ඉඩම පිළිබඳ අදහස් ඉදිරිපත් කළ ගරු නාගරික මන්ත්‍රීතුමා මෙය කාලෝචිත යෝජනාවක් වන බැවින් මේ සඳහා සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස පැවසීය.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා** තුඹගොඩ ගුවන් පාලම පිළිබඳ අදහස් දක්වමින් මෙම යෝජනාව 2013 වර්ෂයේදී ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර

මැතිතුමා සභාවට ගෙනා අවස්ථාවේ දී මහ මාර්ග අමාත්‍යාංශයට ගොස් මේ පිළිබඳව සාකච්ඡා කළ අතර එම අවස්ථාවේදී විශාල වියදමක් වැය වන බව පැවසූ බව සඳහන් කරමින් පාසල් ළමුන්ට ද වැදගත් වන බැවින් මෙය ඉතා අත්‍යවශ්‍ය යෝජනාවක් වන අතර මෙය ඉදිකිරීම සුදුසු බව පැවසීය.

ගුවන් පාලම පිළිබඳ අදහස් දැක්වූ **ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** තමා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උප සභාපති වශයෙන් සිටින කාලයේ දී මෙම ගුවන් පාලම ඉදිකිරීමට උත්සහ කල නමුත් ඒ පිලිබඳ ගැටළු දෙකක් පවතින බව පැවසීය. පන්සල අසලින් බැසීම සඳහා පඩිපෙළක් සකස් කිරීමට ස්ථානයක් නොමැති හෙයින් අනෙක් පසින් පඩිපෙළක් යෙදීමට සිදුවන අතර එසේ කළහොත් ජයන්තිය පාර කුඩා වෙන බව සඳහන් කරන ලදී. එමෙන්ම මෙය ඉතා ශක්තිමත් විය යුතු අතර අඩි 2 1/2 පමණ බැස්මක් තිබිය යුතු බවට බළන්ගොඩ විධායක ඉංජිනේරු තුමා සමග පැවති සාකච්ඡාවේ දී පවසන ලද බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. මෙම ස්ථානයේ මාර්ග තදබදය පවතින්නේ පාසල් නිමවන වෙලාවේ දී පමණක් බැවින්, මේ සඳහා වියදමක් දරනවා ද යන්න රජයේ ප්‍රශ්නය වී ඇති බවත් මෙය ඉටු කරන්නේනම් තමන්ගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවත් පැවසීය. එමෙන්ම ගලපොත්තාරාව කුඹුරු ඉඩම සම්බන්ධව අදහස් දක්වමින් මෙය හොඳ යෝජනාවක් නමුත් තමන් මේ පිළිබඳ පෞද්ගලිකව අකමැති බව පැවසීය. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී ප්‍රතිපත්තියක් ලෙස කුඹුරු ගොඩ කිරීමට විරුද්ධ වූ බව සඳහන් කල ගරු නාගරික මන්ත්‍රීතුමා මෙය ඉටු කරන්නේනම් තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බව පැවසීය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**06:06 ගරු නාගරික මන්ත්‍රිනී එම්.සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

06:06:01 උඩකන්ද නගර සීමාව තුළ සිට කරව්කැටිය ප්‍රධාන මාර්ගය දක්වා ඇති කාණුව හා මාර්ගය සංවර්ධනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රි එම්.සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය උඩකන්ද මාර්ගයේ නගර සභා සීමාවට අයිති 100 m පමණ කොටසක් අලුත්වැඩියා කර ඇති අතර කාණුව ශුද්ධ කර නොමැති බව පැවසීය. එමෙන්ම මෙම කාණුව දෙපැත්තටම අවශ්‍ය නොවන බැවින් පාරේ එක පැත්තකට පමණක් යොදා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. හදිසි යෝජනා**

**07:01: ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

**07:01:01** දැඩි සුළං තත්ත්වය හේතුවෙන් නිවසේ වහලයට අලාභ හානි සිදුවීම සම්බන්ධයෙනි.

ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අංක 526, වෙළේ කඩේ, ඕලුගංතොට, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එම්.මහින්ද රත්නවීර මහතාගේ නිවසේ වහලයට මේ දිනවල පවතින දැඩි සුළං තත්ත්වය හේතුවෙන් අලාභහානි සිදුවී ඇති බව ලිපියකින් තමා වෙත දැනුම් දුන් බැවින් ඒ සඳහා සාධාරණයක් ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටියේය. එමෙන්ම පෙර දිනකදී ද මෙම වහලයට සුළඟ මඟින් හානි වූ අතර මෙවර සම්පූර්ණයෙන්ම වහලයට අලාභ හානි සිදු වී ඇති බව පැවසීය.
මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමා මෙම නිවාස හිමියා සඳහා රු.10,000.00 ක මුදලක් ලබා දීම සුදුසු බව යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් එය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

**07:02:01** 2018.08.08 දින පැවති මහ සභාවේ 05:10:01 යෝජනාව සම්බන්ධවයි

ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් ඉදිරිපත් කරන ලද **ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා** පවසා සිටියේ 2018.08.08 දින පැවති මහ සභාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා ගෙන එන ලද 05:10:01 යෝජනාව සම්බන්ධයෙන් අද විශාල මහජන විරෝධයක් සමාජය තුළ පැන නැගී ඇති බවත්, එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට පෙර අප ගරු සභාවේ එකී යෝජනාව ගෙන ආ ආකාරය නිවැරදි සභා සම්මුතියකට පටහැනි බව එම සභා වාර්තාව පරීක්ෂා කිරීමේදී වැටහී ගිය කරුණක් බවත්, එම නිසා එකී යෝජනාව පරිච්චින්න කිරීම සඳහා යෝජනාවක් 2019.08.15 දින මහ සභාවට ගරු නාගරික මන්ත්‍රීවරුන් හත්දෙනෙකුගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරන බවත් පැවසීය.

එමෙන්ම මෙම යෝජනාව සම්බන්ධව සභාව විසින් තීන්දුව ගත් ආකාරය වැරදි සහගත වීම හා සභා වාර්තාවේ නිවැරදිව සටහන් නොවීම ආදිය මෙන්ම 1975 අංක 04 දරණ වීථි නම් කිරීමේ පනත හා මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛ අනුව ස්වේච්ඡා සංවිධාන විසින් මෙම යෝජනා ගෙන ආ යුතු වුවද එසේ නොවීම නිසා යෝජනාවම වැරදි බව සඳහන් කරන ලදී. තවද මහජනතාවගෙන් විශාල දෝෂාරෝපණයක් පැණ නැගුනු අතර අද දින සභාවට මහජනතාව පැමිණීමට සැරසුණු බැවින් නගර සභා ආඥා පනතේ 55 වගන්තිය යටතේ මෙම යෝජනාව පරිච්චින්න කිරීමට අවශ්‍ය බව පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් අද දින සභාවට තමන් නීත්‍යානුකූලව මෙම යෝජනාව ගෙන ආ බවත්, අබුසාලි මහතා බලන්ගොඩ ජනතාවට රැකියා ලබා දී ඇති අතර ඇමතිවරයෙක් වශයෙන් එතුමාට ගරු කරන බවත් පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා** පවසා සිටියේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා එදා එම යෝජනාව ගෙන ආ අවස්ථාවේදී තමන් එය ස්ථිර කළ අතර අද දින ද තමන් නැවත වරක් එය ස්ථිර කරන බවයි.එමෙන්ම හිටපු ඇමතිවරයෙක් වූ අබුසාලි මැතිතුමා බලන්ගොඩ නගරයට විශේෂ මෙන්ම විශාල වැඩ ප්‍රමාණයක් කළ අතර සබරගමුව විශ්ව විද්‍යාලය එතුමා විසින් ගෙන එන ලද්දක් බව සඳහන් කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ **ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලීක්ෂා මැතිතුමා** පවසා සිටියේ වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ගෙන ආ යෝජනාවට තමන් කණගාටුවන අතර අබුසාලි මැතිතුමා තමන්ගේ ඥාතියෙක් වන බැවින් මේ පිළිබඳ කථා කිරීමට අයිතිය තමන්ට තිබෙන බවයි. එමෙන්ම 1977 වසරේදී බලන්ගොඩ මුස්ලිම් ඡන්ද හත්සිය ගණනක් පමණක් තිබූ නමුත් සිංහල ජනතාවගේ ඡන්ද ලබා විශිෂ්ඨ ජයග්‍රහණයක් එතුමා ලබා ගත් බව වැඩිදුරටත් පැවසීය.

වැඩිදුරටත් අදහස් දක්වමින් අබුසාලි මැතිතුමා විසින් සබරගමුව විශ්ව විද්‍යාලය ආරම්භ කල අතර එම නිසා සබරගමුව විශ්ව විද්‍යාලයේ පවතින සෑම උත්සවයකදීම එතුමාට ස්තුති කරන බව පැවසීය. එමෙන්ම උඩගම විද්‍යාලයට විශාල වැඩ කොටසක් කරමින් දියුණු තත්ත්වයකට ගෙන ඒමට එතුමා කටයුතු කළ අතර බළන්ගොඩ නව නගර නිර්මාතෘ ලෙස එතුමා නම් කළ හැකි බවත්, සමනල වැව ව්‍යාපාරයට විශාල වැඩ කොටසක් කළ බවත් පැවසීය. එමෙන්ම නගර සභාවේ සභාපති වශයෙන් ද ටික කාලයක් සේවය කර ඇති එතුමා ජීවතුන් අතර සිටියේ නම් අද කොතරම් දුක් වේ දැයි විමසා සිටියේය. එමෙන්ම මරික්කාර් මැතිතුමා ද දෙවරක් නගර සභාවේ උප සභාපති වශයෙන් සිටි බව වැඩිදුරටත් පැවසීය.

ගරු අධිකරණ අමාත්‍ය තලතා අතුකෝරළ මැතිතුමිය මෙවන් පුද්ගලයෙකුගේ නමක් කුඩා මාර්ගයක් සඳහා යොදන්නේ ඇයි දැයි විමසා සිටි බව පැවසූ ගරු මන්ත්‍රීතුමා අබුසාලි මැතිතුමා සිටි කාලයේදී පන්සල් වලට විශාල මෙහෙයක් සිදු කර ඇති අතර තුඹගොඩ විහාරස්ථානය සඳහා ජපානයේ සිට බුදු පිළිම වහන්සේ වැඩම කරවමින් බෞද්ධ ජනතාවට උදව් කළ බව පැවසීය. මුස්ලිම් අන්තවාදීන් සිටින නමුත් මුස්ලිම් ජනතාව අන්තවාදීන්ට විරුද්ධ වන අතර පෙත්සම ඉදිරිපත් කළ පිරිස අබුසාලි මැතිතුමා නොදැක ඇති යැයි සඳහන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා** පවසා සිටියේ නීතිමය ක්‍රමවේදයෙන් බැහැරව වීථි නම් කිරීමේ පනතේ කරුණු 3 ක් උල්ලංඝනය කරමින් මෙම යෝජනාව ගෙන ආ නිසා අදාල යෝජනාව පරිච්චින්න කිරීමේ යෝජනාව ගෙන එන බවයි.

මෙහිදී අදහස් ඉදිරිපත් කළ **ගරු නාගරික මන්ත්‍රී ඒ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා** හා **ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා** අදහස් දක්වමින් පවසා සිටියේ පුද්ගලික නාම යෙදීමේ දී සැම විටම ගැටලු ඇති වන බැවින් පොදු නාම යෙදීම වඩාත් සුදුසු බවයි.

**ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා** අදහස් දක්වමින් මෙම යෝජනාව අවලංගු කරන්නේ නීතිමය ප්‍රශ්නයක් හේතුවෙන් මිස පුද්ගලයා පිළිබඳ ගැටළුවක් නිසා නොවන බව පැවසීය. සියළු දෙනා අබුසාලි මැතිතුමාට ගරු කරන නමුත් මාලීක්ෂා මැතිතුමා එය වැරදි විදිහට තේරුම් ගත් බව පවසමින් සමනල වැව ව්‍යාපාරය ආරම්භ කළේ මල්ලිකා රත්වත්ත මහත්මිය වන බව වැඩිදුරටත් සඳහන් කරන ලදී. පාස්කු ඉරු දින සිදුවූ ප්‍රහාරයත් සමඟ ඇති වූ තත්ත්වය නිසා එළඹෙන ජනාධිපතිවරණය අප්‍රසන්නව සිදු වන බවත්, මෙය සමාජ ප්‍රශ්නයක් බවට පත්ව ඇති නිසා විසඳීමට කාලයට ඉඩ දිය යුතු බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කළේය.

මෙහිදී පිළිතුරු ලබා දුන් **ගරු සභාපතිතුමා** තානායම් පිවිසුම් මාර්ගය " එම්.එල්.එම්.අබුසාලි මාවත" ලෙස නම් කිරීමේ යෝජනාව සභා වාර්තාවේ පවතින දෝෂ නිසා අවලංගු කිරීමට සිදු වන බවත්, මාර්ග සඳහා පුද්ගල නාම නොමැතිව පොදු නාම යෙදීමට කටයුතු කරන ලෙසත් පවසා සිටියේය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.06.26 දින හා 2019.07.04 දින පැවති මුදල් කමිටු වාර්තා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **9,186,346.77** |
| වෙනත් ලැබීම් | **787,606.25** |
| මුලු ලැබීම් | **9,973,953.02** |
| පුනරාවර්තන වියදම් | **9,629,774.02** |
| වෙනත් වියදම් | **1,600,430.11** |
| මුලු වියදම් | **11,230,204,13** |

**ඉන්ධන වාර්තාව ඉදිරිපත් කිරීම.**

2019-07-01 සිට 2019-07-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---:|
| 226-7521 | 18,720.00 |
| 227-5020 | 24,715.00 |
| 56-1906 | 20,592.00 |
| BC-0005 | 32,020.00 |
| DDR-0008 | 1,560.00 |
| FP-0002 | 8,400.00 |
| RD-8000 | 5,200.00 |
| GC 0001 | 4,760.00 |
| | 4,080.00 |
| WB 003 | 136.00 |
| GK-1483 | 5,200.00 |
| GK-6227 | 22,916.00 |
| JD-4684 | 2,760.00 |
| LL-2110 | 28,749.00 |
| ND-5124 | 29,016.00 |
| OS-0006 | 2,720.00 |
| SDRR0013 | 1,040.00 |

| | |
|---|---|
| ov/m 0017 | 624.00 |
| PF-4006 | 32,400.00 |
| QL-2901 | 4,352.00 |
| RB-4786 | 33,818.00 |
| | 820.00 |
| | 795.00 |
| LL7688 | 11,715.00 |
| DDP006 | 3,948.00 |
| RC-1107 | 28,140.00 |
| RC-1118 | 35,396.00 |
| RC-8183 | 26,830.00 |
| RD-8240 | 33,980.00 |
| RE-2600 | 34,320.00 |
| UQ - 1933 | 4,080.00 |
| vi-1833 | 1,200.60 |
| MXB0011 | 690.00 |
| YG-0758 | 1,380.00 |
| ZA - 5039 | 52,610.00 |
| **එකතුව** | **519,682.60** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

10. **පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා</u>**

තමාගේ දෙවන දියණියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය සිදු වූ නිසා මේ මොහොතේ තමා ශෝකාකුලව සිටින බවත්, ඒ සඳහා සහභාගි වූ ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම් තුමිය ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදීන්ටත් තමා මේ අවස්ථාවේ දී ස්තුතිවන්ත වන බව පැවසීය.

**<u>ගරු නාගරික මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා</u>**

දැන්වීම් පුවරු සම්බන්ධයෙන් කථා කිරීමේ දී පරණ කොමර්ෂල් බැංකුව, තුඹගොඩ හා ඔරලෝසු කණුව යන ස්ථානයන්හි අඩි 10-20 ක ප්‍රමාණයේ දැන්වීම් පුවරු සවිකිරීමට හැකිනම් සෑම ස්ථානයකම බැනර්, කටවුට් ප්‍රදර්ශනය කිරීම නිසා මතුව ඇති ප්‍රශ්නය විසඳිය හැකි බව පැවසීය. එසේ සවි කිරීමට හැකිනම් ගාස්තුවක් අය කරමින් එය ලබා දිය හැකිවන අතර එසේ නොමැතිව බැනර් කටවුට් කැපීම සාධාරණ නොවන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පවසා සිටියේ බළන්ගොඩ රෝහලෙන් පිට කරන අපද්‍රව්‍ය පිළිස්සුම් උදුන වෙත රැගෙන යාම සඳහා අවශ්‍ය වාහනය සභාවෙන් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසයි.

එහිදී ගරු සභාපතිතුමා, මේ වන විටත් අවශ්‍ය අවස්ථාවල දී රෝහලෙන් දැනුම් දුන් පසු එම කාර්ය සඳහා වාහනයක් යොදවන බව පැවසීය.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල අංක 09/10 කඩ කාමර වෙළඳාම් කරන පුද්ගලයන් සභාවට ගෙන්වමින් සභාවේ මතය ඔවුන්ට ප්‍රකාශ කිරීමේ උතුම් කාර්ය ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා සිදු කිරීම සම්බන්ධව එතුමාට තමාගේ ස්තුතිය පුද කරන බව පැවසීය. එමෙන්ම අපි සභාවේ කථා කරන කාරණා සභාවෙන් එළියට ගොස් වෙනස් කරමින් පාවා දීම සිදු කරන බැවින් එය වැරදි සහගත බව පැවසීය. රටේ ඇති වී තිබෙන වාතාවරණය සමඟ සියළු මුස්ලිම් ජනතාව දෙස සැක සහිතව බැලීම කාලය විසින් විසඳෙන බව පැවසූ ගරු උපසභාපතිතුමා දේශපාලන වාසි බලාගෙන කටයුතු නොකරන ලෙස ද කාලෝචිත නොවන යෝජනා ගෙන ඒමෙන් වැළකී එකමුතුව සමඟියෙන් කටයුතු කිරීම සුදුසු බව ද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මාලික්ෂා මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ දේශපාලනය සිදු කිරීමේ දී තමා කිසිවෙකු පාවා නොදෙන බවත්, කිසිවෙකුට විරුද්ධව කතා නොකරන අතර සියලුදෙනාට ගරු කරමින් කටයුතු සිදු කරන බවත් ය. එබැවින් වැරදි අදහස් සමාජයට ගෙනයාමෙන් වැළකී සිටින ලෙස ඉල්ලා සිටි ගරු මන්ත්‍රීතුමා ඇතැම් අය වැරදි සිදු කර ඒවා නිවැරදි කිරීමට උත්සාහ ගන්නා බව පැවසීය. එමෙන්ම මුස්ලිම් මන්ත්‍රීවරයෙකු ඌරු මස් කඩයක් දැමීමේ යෝජනාවට මනාපව ඡන්දය දීම ඉතිහාසගත වන බව වැඩිදුරටත් පවසන ලදී.

**11. අවසානය**

මෙහිදී අදහස් ඉදිරිපත් කළ ගරු සභාපතිතුමා පවසා සිටියේ අද අප රට තුළ ජාතිකත්වය, එකමුතුව හා ශ්‍රී ලාංකිය මතයක් නොමැති වීම නිසා ඉදිරි මැතිවරණය ආගම්වාදය ජාතිවාදය මත පදනම්ව තම ආගම ජාතිය කියා ගන්නා පිරිසක් විසින් සහෝදරත්වය පලුදු වන ආකාරයට කටයුතු කරන බවයි. එමෙන්ම රටේ දැන් සිටින තරුණ කණ්ඩායම් අක්මුල් සිඳගත්, දුර දිග නොබලා ක්‍රියා කරන පිරිසක් බැවින්

ඔවුන්ට මුහුණ දීමට හා අභියෝග කිරීමට හැකියාවක් නොමැති වීමත්, රටේ ඉතිහාසය කණපිට පෙරළා බොරු ඉතිහාසයක් රට තුළ ස්ථාපිත කිරීමට උත්සහ ගන්නා ජාතිවාදි හා ආගම්වාදී කණ්ඩායමක් ඔවුන්ව දේශපාලන අතකොළු ලෙස භාවිතා කිරීම වැරදි බවත් පවසන ලදී. එබැවින් ඔවුන්ට නිවැරදි මඟ පෙන්වීමක් කල හැකිනම් රට ඉදිරියට ගෙන යා හැකි බව පැවසූ ගරු සභාපතිතුමා තමන්ගේ රටේ ඉතිහාසය, ගමේ ඉතිහාසය වලලන පිරිසක් බිහි වී තිබෙන බවත්, එදා දේශපාලනය සමාජ සේවයක් විදිහට කළ නමුත් අද දේශපාලනය ව්‍යාපාරයක් ලෙස කරගෙන යන බව වැඩිදුරටත් පැවසීය.

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කිරීමට සහයෝගය ලබා දෙමින් සභාවට සම්බන්ධ වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුද කල ගරු සභාපතිතුමා ප.ව.03.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කළේය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.